රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
**Ministry of Public Administration and Management**
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

| දුරකතන<br>தொலைபேசி: (94) 011-2696211-13<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல் (94) 011-2695279<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல் secretary@pubad.gov.lk<br>E-mail |
|---|---|---|

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No } 76/1/15/විශේෂ VIII වෙළුම | ඔබේ අංකය<br>உமது இல<br>Your No } | දිනය<br>திகதி<br>Date } 2016.12.09 |

**සියළුම අමාත්‍යාංශ / පළාත් සභා ප්‍රධානීන් මඟින්,**

**විශේෂ ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයට කැඳවන නිලධාරීන් වෙත (ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණිය),**

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - 2016.07.01</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක **76/1/15/විශේෂ VIII** වෙළුම හා **2016.10.06** දිනැති ලිපියට අනුකූලව ඉදිරිපත් කරනු ලැබූ ඔබේ අයදුම්පත්‍රය සම්බන්ධයෙන් වන සම්මුඛ පරීක්ෂණය **2016.12.17** හා **2016.12.18** යන දෙදින රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ 1 වන මහලේ ලේකම්තුමාගේ නිල කාමරයේදී පැවැත්වේ. අදාළ දින ඉහත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලේඛනද රැගෙන සහභාගී වන මෙන් කාරුණිකව දන්වමි.

I. ජාතික හැඳුනුම්පත හා එහි සහතික කරන ලද පිටපතක් (හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත අනිවාර්ය වේ.)

II. පශ්චාත් උපාධි සහතිකයෙහි හා විස්තරාත්මක සහතිකයෙහි මුල් පිටපත්

III. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ අනුමත ලකුණු පටිපාටිය අනුව පහත ලේඛන,

(අ). ලකුණු පටිපාටියේ සඳහන් " නව්‍යතාවයන් සහ නවෝත්පාදනයන් " යටතේ අයදුම්කරු විසින් පසුගිය වසර 05 ට අදාළ කාර්ය සාධන වාර්තාවලට අනුව සාර්ථකව නිමකරන ලද කාර්යයන් 04 ක් පිළිබඳ තොරතුරු ඇමුණුම 01 පරිදි

(ආ). ඇමුණුම 01 හි සඳහන් කරන ලද කාර්යයන් සම්බන්ධව ප්‍රදානයන්, ප්‍රශංසා හෝ සහතික පත්‍ර ලැබී තිබේ නම් එම ලේඛන

(ඇ). ඉදිරිපත් කිරීමට (Power Point Presentation) අදාල මෘදු පිටපත (PDF Format) සහ දෘඪ පිටපතෙහි පිටපත් 02 ක් (සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම සකසන්නේ නම් එහි ඉංග්‍රීසි පිටපතක්ද ඉදිරිපත් කළ යුතුවේ. )

2 සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම වෙනුවෙන් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

තුෂාරා ඩී. පතිරණගේ
අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ)

අ.ක / ජේ. ජේ. රත්නසිරි
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය.

ඇමුණුම **01**

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය</u>**

**කුසලතාවය**

I. <u>නව්‍යතාවයන් හා නවෝත්පාදනයන් (Innovativeness and Creativity)</u>

පසුගිය වසර 05 ක කාර්යසාධන වාර්තා වලට අදාලව සම්පූර්ණ කරන ලද කාර්යයන් 04 ක් පිළිබඳ තොරතුරු

| අනු අංක | සම්පූර්ණ කරන ලද කාර්යය (කාර්ය සාධන වාර්තා වලට අනුව) | අදාල වර්ෂය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

II. ඉදිරිපත් කිරීම (Power Point Presentation)

ඉහත කාර්යයන් අතරින් ඉදිරිපත් කිරීම සඳහා යොදාගනු ලබන කාර්යය

……………..……………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

දිනය **:** …………………………

අත්සන ;………………………………………………

නම**:** ……………………………………………………

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

කාර්යසාධන වාර්තා සමඟ පරීක්ෂා කරන ලදි**.:** …………………………………………